**දඹුල්ල ප්‍රාදේශීය සභාව.**

**-------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**-----------------------**

1. මූල්‍ය ප්‍රකාශන
--------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 16 දින විගණනයට ඉදිරිපත්කර තිබුණි.

1.2 ගනුදෙනු මෙහෙයුම් හා කාර්යය සාධනය පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------------------------------------

1.2.1 අසම්භාව්‍ය බැරකම්
-----------------------

ජාතික යන්ත්‍රෝපකරණ ඒකකයට ගෙවිය යුතු රු.292,068 ක මුදල් නොගෙවීම මත එම ආයතනය විසින් 2012 පෙබරවාරි 21 දින සභාවට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන සභාවට සිතාසි නොලැබීම නිසා නඩුවට සහභාගි නොවීම හේතුවෙන් පැමිණිල්ලේ වාසියට ඒක පාර්ශ්විකව නඩු තීන්දුව ලබාදී තිබූ බැවින් සභාව විසින් 2016 පෙබරවාරි 02 දින මෝසමක් ඉදිරිපත් කර තිබුණි.

2. ආදායම් පරිපාලනය
------------------------

2.1 වරිපනම් බදු
---------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් අයකළ හැකි දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2 බදු කුලී
--------

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.1,426,662 ක හිඟ බදු කුලී ශේෂයෙන් වර්ෂය තුළ රු.464,442 අයකරගෙන තිබුණු අතර රු.962,220 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බදුකුලී ශේෂය රු.24,590 ක් විය.

2.3 බලපත්‍ර ගාස්තු
----------------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.5,007,282 ක් වූ අතර ඉන් ඉකුත් වර්ෂ වලට අදාළව අයකරගත යුතුව තිබූ මුදල රු.48,950ක් විය.

2.4 සේවා සඳහා ගාස්තු
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි සේවා ගාස්තු ශේෂය රු.1,851,837 ක් විය.

2.5 වෙනත් ආදායම්
------------------

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝටලයක ආපනශාලාවක හෝ නවාතැන්පලක ආදායමෙන් සියයට එකක බදු මුදලක් පළාත් පාලන ආයතන වලට අයකළ හැකි වුවද සභාව විසින් සභා සම්මුතියක් හා ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය

මත සමාලෝචිත වර්ෂයේ එකී ව්‍යාපාර වල සමස්ථ ආදායමෙන් 0.3% ක් අය කිරීමට කටයුතු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වෙනත් ආදායම් ශේෂය රු.6,950,776 ක් වූ අතර එය මුළු වෙනත් ආදායමෙන් සියයට 79 ක් තරම් වූ වැඩි අගයක් විය.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හෝටල් වලින් අතුරු ව්‍යවස්ථා පනවා කසල ගාස්තු අයකල හැකි වුවද ඒ සඳහා සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) ත්‍රී රෝද රථ ගාල් හා කුලී රථ වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවාගෙන ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.6 මුද්දර ගාස්තු
----------------
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.4,815,849 ක මුදලක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.9,941,070 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------
3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------
පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුරනැගුම ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය සභා කාර්යාලය ස්ථාපිත කිරීමට ගොඩනැගිල්ලක් ඉදිකර 2015 මාර්තු 17 දින සභාව වෙත භාරදී තිබුණද එම කාර්යාලයට සභාව ගෙන යාමට කටයුතු නොකර නගර සභා සීමාවේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරි ගොඩනැඟිල්ලේ කුලී ගෙවමින් කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණි. මෙම කාර්යාලය මුර කිරීම වෙනුවෙන් මුරකරුවන් දෙදෙනෙකුට 2015 මැයි සිට 2016 මැයි දක්වා වැටුප් වශයෙන් රු.871,006 ක් ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවේ සේවය කර මිය ගිය, වැඩ තහනම් කළ, සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.106,065 ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාවේ තනතුරු 04 කට අදාළ පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවේ සභිකයින්ට හා ස්ථිර කාර්යය මණ්ඩලයට ගෙවූ වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණ නොවීම නිසා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය නොවූ වැටුප් හා දීමනා රු.4,607,205ක් විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජූලි මාසයේ ක්‍රියාත්මක කරන ලද ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මිලදී ගෙන තිබුණු රු.53,650 ක් වටිනා කසළ බඳුන් 37 ක් ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව කාර්යාල පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී නිසි අනුමැතියක් නොමැතිව සභාවේ නිලධාරීන් දෙදෙනෙකුට රු.53,441 ක නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි.

3.3 හඳුනාගත් අලාභ

-------------------

සභාව සතු අංක WPPF-3330 දරන කැබ් රථය 2015 අප්‍රේල් 13 දින අනතුරකට පත්ව තිබූ නමුත් මෙම අනතුර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 104(04) ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. වාහනයේ දෝෂ කිසිවක් නොමැති බව මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවේ දැක්වුනු අතර පොලීසිය විසින් මෙම අනතුර සම්බන්ධයෙන් නඩු පවරා තිබුණි. මෙම වාහනය අළුත්වැඩියා කිරීමට නියෝජිත ආයතනය වන ඇසෝසියේටඩ් මෝටර්වේස් පෞද්ගලික ආයතනයෙන් රු.6,152,103 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇතත්, අනතුර සිදුවී වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

තවද මෙම වාහන අනතුරින් විදුලි කණුවකට හානි සිදුවී තිබුණු අතර දඹුල්ල විදුලි අධිකාරිගේ ඇස්තමේන්තුව අනුව රු.51,868 ක අලාභයක් සිදු වී තිබුණි. අලාභහානි පිළිබඳ පරීක්ෂණයක් සිදු නොකර 2015 අවසන් මහා සභා රැස්වීමේදී මෙම අලාභය ගෙවීමට අනුමැතිය ලබාදී තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.500,000 ක් වැය කර නිග්ගොල්ලයාය මාර්ගය සංවර්ධනය කර තිබුණි. මෙහිදී වැඩ විෂය අංක 01 යටතේ 915 mm හියුම් පයිප්ප ප්‍රවාහනය සඳහා 24 km ක තාර්කික නොවන දුරක් සඳහා රු.9,775 ක් ගෙවා තිබුණි. එමෙන්ම මාර්ගයේ බොරළු ඇතිරීම සඳහා වැඩ විෂය අංක 2.4 යටතේ 177 $m^2$ සඳහා රු.35,046 ක ගෙවීම් කර තිබූ නමුත් 2015 ඔක්තෝබර්016 දින භෞතික පරීක්ෂාවේදී බොරළු දක්නට නොලැබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ජනකම්ණිපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් පන්නම්පිටිය ගොවි සංවිධානයට රු.143,578 ක් ගෙවා තිබුණි. මෙහිදී වැඩ විෂය අංක 04 යටතේ වර්ග මීටරයකට ලීටර් 02 ක් වැටෙන සේ උණුතාර දමා වැලි ඉස ඩිරෝල් කිරීමට වර්ග මීටර් 144 ක් සඳහා රු.38,304 ක් ගෙවා තිබුණද අවසන් මීටර් 100 තුළ ස්ථාන කිහිපයක වලවල් සෑදී තිබූ අතර වැඩ විෂය අංක 05 යටතේ දෙවන වර තාර ආලේප කිරීම සඳහා වර්ග මීටරයකට ලීටර් 01 ක් වැටෙන සේ උණු තාර දමා වැලි ඉසීමට වර්ග මීටර් 300 ක් සඳහා රු.42,900 ක් ගෙවා තිබුණද දෙවන වර තාර ආලේපය සාර්ථක ලෙස ඉටු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පන්නම්පිටිය සුසානාගාරය ඉදිකිරීම වෙනුවෙන් රු.200,000 ක් පන්නම්පිටිය ගොවි සංවිධානයට ගෙවා තිබුණි. මෙහිදී වැඩ විෂය අංක 10 යටතේ ගෙබිම පස් පුරවා සකස් කිරීම සඳහා 5 $m^2$ කට රු.6,309 ක් ගෙවීම් කර තිබුණද, ගෙබිම සකස් කිරීමක් සිදුකර නොතිබුණි. එමෙන්ම අතරුඳවුම් තබා නොගෙන සම්පූර්ණ මුදලම එකවර ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගල්ලෙනවත්ත අතුරු මාර්ගය සංවර්ධනය සඳහා රු.405,886 ක් වැයකර තිබුණි. මෙම කර්මාන්තයේ වැඩ විෂයය අංක 02 යටතේ පැති කාණු කැපීම සඳහා මීටර් 900 ක් වෙනුවෙන් රු.41,400 ක් ගෙවා තිබුණද, 2015 ඔක්තෝබර් 16 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී පැතිකාණු දක්නට නොලැබුණි. වැඩ විෂයය 03 යටතේ 337m³ බොරළු ඇතිරීමට රු.114,243 ක් ගෙවා තිබුණද එම ප්‍රමාණයෙන් බොරළු පුරවා නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ රු.4,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. 2015 ඔක්තෝබර් 16 දින ඉදිකිරීම් පරික්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සභාව විසින් ද්‍රව්‍ය හා ශ්‍රමය යොදවා සභාවේ නඩත්තු ඒකකය මඟින් ව්‍යාපෘති ඉටුකළ යුතු වුවත් එම උපදෙස් අනුගමනය නොකර ඇස්තමේන්තු සකස් කිරීමේදී ලාභ එකතු කළ රේටයන් පදනම් කරගෙන අනුමත සමිති වලට කොන්ත්‍රාත් ප්‍රදානය කර ව්‍යාපෘති ඉටුකරගෙන තිබුණි.

(ii) 2014 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොමැති ව්‍යාපෘති අවලංගු වන බව හා වියදම් නොකර ඉතිරිව පවතින මුදල් 2015 මැයි 15 දිනට පෙර රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රික පාලනය පිළිබඳ අමාත්‍යාංශයට යවන ලෙස දන්වා තිබුණද 2015 ජූනි 10 වන විටද ඉතිරි රු.1,802,500 ක මුදල අමාත්‍යාංශයට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

විධිමත් කසල බැහැර කිරීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකිරිම හේතුවෙන් දිනපතා එකතුවන කසළ වෙන් කිරීමකින් තොරව සභාවේ ට්‍රැක්ටරයක් හා සේවකයින් යොදා සතියකට දින 03 ක් දිගම්පතහ ප්‍රදේශයේ රජයේ ඉඩමකට බැහැර කර තිබූ අතර කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ පිළිවෙලක් සඳහා සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

3.6 පාරිසරික ගැටළු

------------------

ප්‍රාදේශීය සභාව විසින් ඉවත් කරන කුණු කසල දිගම්පතහ රජයේ රක්ෂිතයට දැමීම සිදුකරන බැවින් මෙම කසල ආහාරයට ගැනීමට වල් අලි ඇතුළු සතුන් එම ස්ථානයට පැමිණීම හේතුවෙන් වන සතුන්ට මෙන්ම පරිසරයටද විශාල හානියක් සිදුවෙමින් පැවතුණි.

3.7 වත්කම් කළමනාකරණය

------------------------------

(අ) <u>නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්</u>

(i) අංක 53-4724 දරන මිට්ෂුබිසි කැබ් රථය යුධ හමුදාව විසින් රැගෙන ගොස් 2007 වර්ෂයේදී නැවත ප්‍රාදේශීය සභාවට ලබාදී තිබුණි. මෙම වාහනය වෙන්දේසි කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ii) අංක SW-1448 දරන මෝටර් ග්‍රේඩරය 2015 වර්ෂයේ ජනවාරි මස සිට ධාවනය කර නොතිබූ අතර සෙනොක් ආයතනයේ පරීක්ෂණ වාර්තාව අනුව සිදුකල යුතු වාර සේවාවන් නිසි පරිදි සිදුකර නොතිබීමෙන් මෙම යන්ත්‍රය ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයට පත්වී ඇති බව දන්වා තිබුණි. මෙම වාහනය අලුත්වැඩියා

කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් නොගෙන සහා භූමියේ ගාල්කර තිබුණි.

(iii) සභාව බ්ලොක් ගල් නිෂ්පාදනයට යොදා ගෙන තිබුණු රු.200,000 ක් වටිනා බ්ලොක් ගල් යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ තිබුණි.

(ආ) <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2016 මැයි 19 වන විටත් සිදුකර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය
-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය
------------------------

අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරියෙක් පත්කර තිබුණු නමුත් එම නිලධාරියාට කාර්යාලයේ වෙනත් රාජකාරිද පවරා තිබුණි. විගණන වැඩ සටහන් පිළියෙල කර නොතිබූ අතර අභ්යන්තර විගණන වාර්තා ඉදිරිපත් නොවුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
---------------------------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇතත්, කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

4.3 නොවිසිඳී ඇති හා පිලිතුරු නොලත් විගණන විමසුම්.
------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ සභාව වෙත ඉදිරපත් කර තිබූ විගණන විමසුම් වලින් විම්සුම් 02 ක් සඳහා පිලිතුරු ඉදිරපත් කර නොතිබුණි. එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.426,678 ක් විය.

5. පද්ධති හා පාලන
--------------------

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය.
(ඈ) වත්කම් කළමනාකරණය.
(ඉ) මානව සම්පත් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය